# පාලි මහා කාව්‍යය හා ජිනවංශ දීපය

රත්නේ ඤාණසීහ හිමි - ත්‍රිපිටකවේදී උපාධි අපේක්‍ෂක

පාලි භාෂාව හුදු ආගමික භාෂාවකි. එය ආරම්භයේ සිටම යෙදුණේ ආගමික අදහස් ප්‍රකාශ කිරීමටය. ලෝකය පිළිබඳ බැඳුම් වලින් වෙන්වී විරාගී ජීවිතයක් ගත කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ විරාගී සංකල්පනා ව්‍යක්තව ප්‍රකාශ කිරීමට සුදුසු වන පරිදිය එකී වචන හා රචනා ක්‍රමය සකස් වූයේ. විශ්ව සාහිත්‍ය කෘතීන් හා වුවද සැසඳෙන ගණයේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයන් වූ ථේර ගාථා හා ථේරී ගාථාවන් හි පවා ධ්වනිත කරන මූලික දර්ශනය වනුයේ විරාගයයි. ජීවිතයේ ලෞකික පක්‍ෂය හජනය කරන නොයෙක් වර්ණනාවන් හා අවස්ථාවන් විස්තර කිරීම පාලියට නුහුරු දෙයකි. එසේ වුවද පාලි භාෂාව පිළිබඳ ඉන්දීය උරුමය ලංකාවට ලැබුණු පසු ඇතිවූ ප්‍රධාන වෙනස් කමක් නම් එය ඉතිහාසය, කාව්‍යය වැනි ලෞකික විෂයයන් ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනුමයි. මහාවංශය, දීප වංශය වැනි ඉතිහාසමය කෘතීන්ද, දාඨාවංශය, ජිනවංශ දීපය වැනි කාව්‍යාත්මක කෘතීන් ද එහි ප්‍රතිඵල ලෙස සැළකිය හැකිය. පාලි භාෂාව ලෞකික විෂය සඳහා ප්‍රයෝජනයට ගැනීමේ මුල් පියවර වූ වංශ කථා සාහිත්‍යය විෂයෙහි පාලි භාෂාව යොදා ගන්නා ලද්දේ හුදෙක් ආගමික භාෂාව වශයෙන් එය ගැන පැරණි භික්‍ෂූන් තුළ පැවැති ගෞරවය නිසාම බව පෙනේ. එහෙත් පසු කාලයේ දී දාඨාවංශය ජිනවංශ දීපය වැනි මහා කාව්‍ය ලක්‍ෂණයෙන් යුක්ත කාව්‍ය හෝ මහා කාව්‍ය පාලි භාෂාවෙන් රචනා කරන ලද්දේ හුදු ආගමික ගෞරවය නිසාම නොව පූර්ණ සාහිත්‍යයක් වශයෙන් සමකාලීනව ගෞරවය ලැබූ සංස්කෘත සාහිත්‍යයට පාලි සාහිත්‍යයද සම කිරීමේ අපේක්‍ෂාව නිසා බව සිතිය හැකිය. විශේෂයෙන්ම පශ්චාත්-කාලීනව පාලි මාධ්‍යයෙන් මහා කාව්‍ය කීපයක් හෝ බිහි වූයේ මෙම අඩුපාඩුව සපුරා පාලි සාහිත්‍යයේ ගෞරවය රැකීමට බව පෙනේ.

අංග සම්පූර්ණ පාලි මහා කාව්‍ය රචනා වූයේ ඉතාම මෑතදී වුවද මහා කාව්‍ය ලක්‍ෂණ සමහරකින් යුත් ග්‍රන්ථ ලංකා පාලි සාහිත්‍යයේ ආරම්භයේ සිටම පාහේ පැවැතුණි. නිදසුනක් වශයෙන් ක්‍රි. ව. 06 වන ශත වර්ෂයේ දී රචනා කරන ලද මහානාම හිමියන්ගේ මහාවංශයද පොළොන්නරු ධර්ම කීර්ති හිමියන් විසින් රචිත චූලවංශය ද ඒ හිමියන් විසින්ම රචිත දාඨාවංශය ද දැක්විය හැකිය. මහානාම හිමියන්ගේ මහාවංශය විජය රජුගේ සිට මහසෙන් රජු දවස තෙක් ඉතිහාසය ඇතුළත් කාව්‍යමය ග්‍රන්ථයකි. මෙහි විවිධ රජවරුන් පිළිබඳ ඉතිහාසයන් සඳහන් වෙතත්, ප්‍රධාන කථානායකයා ලෙස සලකා ඇත්තේ දුටුගැමුණු රජුය. දුටුගැමුණු රජුගේ චරිතය බාල අවධියේ සිට මහා කාව්‍ය නීතිරීති වලට අනුරූප වන පරිදි විස්තර කොට ඇති බව පෙනේ. සංග්‍රාම, සංග්‍රාම විජය වැනි වර්ණනා අතිශයෝක්තියෙන් දක්නට ලැබේ. ග්‍රන්ථයේ සර්ග බෙදා නැති වුවද මුල් කොටස මහා කාව්‍ය සර්ග සීමාව වන තිහේ සංඛ්‍යාව ඉක්මවා ඇති වුවද පරිච්ඡේදාවසානයේ වෘත්තය වෙනස් කිරීම වැනි ලක්‍ෂණ මෙහි දක්නට ඇත. මහාවංශයෙහිම දෙවන කොටස වූ චූලවංශයෙහි දී මහාවංශයේ දී දුටුගැමුණුට තිබුණු තැන හිමි වනුයේ මහා පරාක්‍රමබාහුටය. ඉතා විශාල පරිච්ඡේද සංඛ්‍යාවක් වෙන් කරමින් කතුවරයා මහා පරාක්‍රම බාහු ගැන ඔහුගේ කුඩා අවධියේ පටන් ඉතා දිග විස්තර ඉදිරිපත් කරයි. මෙහි දී ඉතා විශාල සංඛ්‍යාවක් කථානායකයන් විෂය කොට ගැනීම මහා කාව්‍ය ස්වරූප ගැනීමෙහිලා බාධකයක් බවක් පෙනෙතුදු එය සැලකිය යුතු නොවේ. එයට හේතුව ශ්‍රේෂ්ඨ සංස්කෘත මහා කාව්‍යයක් වූ කාලිදාසගේ රඝුවංශයෙහි පවා මුළු රාජ්‍ය පරම්පරාවක්ම විෂය කොට ගෙන ඇති බැවිනි. එහෙත් මහාවංශයෙහි හෝ චූලවංශයෙහි හෝ මහා කාව්‍යාංග කීපයක් පමණක් අනුගමනය කර තිබීමෙන් ඒවා කෙලින්ම මහා කාව්‍ය ලෙස හැඳින්වීම හෝ ඒ කතුවරුන් මහා කාව්‍යානුකූල ලෙස තම ග්‍රන්ථ සකස් කිරීමට උත්සාහ ගත් බවක් තීරණය කිරීම වැරදි සහිතය. මහාචාර්ය මලලසේකර මහතා තම ලංකා පාලි සාහිත්‍යය යෙහි දී මහාවංශය වීර කාව්‍යයක් වශයෙන් සඳහන් නොකරයි. පසුකාලීන වංශ කාව්‍යයක් වූ දාඨාවංශය ද සමහර මහා කාව්‍ය ලක්‍ෂණවලින් යුතු කාව්‍යයකි. එසේ වුවද මහා කාව්‍යයක් ලෙස එය හැඳින්විය නොහැක්කේ සර්ග බෙදීම වැනි මූලික අංගයන් එහි ඇතුළත්ව නැති බැවිනි. මෑත භාගයේ රචිත ශාසනවංශ දීප කාව්‍යය ද මහා කාව්‍යයක් ලෙස සමහරුන් සලකතත් එහි එතරම් මහා කාව්‍ය ලක්‍ෂණ ගැබව නැත. එය හුදු ඉතිහාස කාව්‍යයක් පමණි.

නියම වශයෙන්ම පාලි මහා කාව්‍ය ලෙස හැඳින්විය හැකි ග්‍රන්ථ බිහි වීමට පටන් ගත්තේ මෙම විසිවන ශත වර්ෂයේ මුල සිටය. මේ ග්‍රන්ථ මාලාව අතරේ ප්‍රථම ස්ථානය ක්‍රි. ව. 1917 දී රචිත ජිනවංශ දීපයටද දෙවන ස්ථානය 1924 දී රචිත මහා කස්සප චරිතයටද හිමි වේ. ඉතා මෑත දී හේන්පිටගෙදර ඤාණසීහ හිමියන් විසින් රචනා කරන ලද ගාමණී ගීතා ව මේ ගණයට වැටෙන අලුත්ම කෘතිය වේ.

පණ්ඩිත මොරටුවේ මේධානන්ද හිමියන් විසින් රචනා කරන ලද ජිනවංශ දීපය සංස්කෘත මහා කාව්‍ය ලක්‍ෂණ අනුගමනය කරමින් මහා කාව්‍යයක් ලෙස රචනා කරන ලද මුල්ම කෘතිය වේ. මෙම කෘතිය පද්‍ය දෙදහසකින්ද සර්ග තිහකින්ද පරිමිත වේ. මෙම සර්ග තිහ අතුරින් දහ අටවැනි සර්ගය තෙක් කොටස බුද්ධත්වය තෙක් බුද්ධචරිතය ප්‍රකාශ කිරීමටද එතැන් සිට විසිහත් වන පරිච්ඡේදය තෙක් වූ කොටස බුදුගුණ ප්‍රකාශ කිරීමටද සෙසු පරිච්ඡේද සතර නැවත ධාතු පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය ප්‍රකාශ කිරීමටද යොදා ගෙන ඇත. මහා කාව්‍යයක් වශයෙන් සලකන විට මෙහි කාව්‍ය නායකයා බුදුරජාණන් වහන්සේය. අංග සම්පූර්ණ මුල්ම පාලි මහා කාව්‍යය වූ මෙහිදී කතුවරයා තමාට යොදා ගැනීමට හැකි සෑම මහා කාව්‍ය ලක්‍ෂණයකින්ම ඉහළම ප්‍රයෝජන ලබා ගනී. කතා නායකයා වශයෙන් සලකන විට, ඒ සඳහා කතුවරයා යොදා ගන්නා චරිතය බෞද්ධයෙකු වශයෙන් ඔහුට ලබාගත හැකි උසස්ම චරිතයයි. චතුරොදාත්ත නායකම් යනුවෙන් දක්වන ලද ලක්‍ෂණ බුද්ධ චරිතයේ විවිධ අවස්ථා ආශ්‍රයෙන් ඔප්පු කිරීමට ඔහු සමත් වේ. ධර්ම - අර්ථ - කාම - මොක්‍ෂ යන චතුර් වර්ග ඵලය බුදුරදුන්ගේ ගිහි ජීවිතයේ හා පැවිදි ජීවිතයේ විවිධ අවස්ථා ආශ්‍රය කොට සම්පූර්ණ කෙරේ. කතුවරයා තෘප්තිමත් වූයේ සර්ග ඇතුළත් කිරීමේදී ඒ සඳහා ඇති ඉහළම සීමාවෙන්ය. මහා කාව්‍යයක තිබිය යුතු අලංකාර දුෂ්කර බන්ධන වැනි සියල්ලක්මත් හැකි සෑම තැනකදීම යොදා ගෙන ඇත.

කතුවරයාගේ ප්‍රයත්නය ගැන සඳහන් කරන මලලසේකර මහතා මෙසේ පවසයි. ඔහුගේ අභිමතාර්ථය විශිෂ්ට ලෙස සාර්ථකව ඇත. අනේක විධ වෘත්තයන් ගෙන් රචිත එහි පද්‍යයන් අතුරින් සමහර ඒවා දුෂ්කර බන්ධනයන් වන අතර සියල්ලම ඉතා පරීක්ෂාවෙන් රචිත බව පෙනේ. සංස්කෘතික කවීන්ගේ කෘතීන්හි නියම අවබෝධයක් ලබා ඇති මේධානන්ද හිමියන්ගේ කෘතිය ඔවුන්ගේ ප්‍රශස්තතම රචනයට ඉතා ආසන්න වන උපමා රූපක ආදියෙන් පිරී ඇත. මෙම කාව්‍යයෙහි භාෂාව සංස්කෘත ආභාසය දැඩි ලෙස තිබුණු බව පෙන්වන අතර මෙහි සමපීණ පද්‍යයන් සංස්කෘතයෙන් රචිත වීම එම යුගයේ ලක්ෂණය විය. ( ලංකා පාලි සාහිත්‍යය පිට 237 ) මහාචාර්ය මලලසේකර මහතාගේ වචනවලින්ද ප්‍රකාශ වන පරිදි කතුවරයාගේ ප්‍රයත්නය විශිෂ්ට බවට සැකයක් නැත. එහෙත් පාලියට නුහුරු දෙයක් කිරීමට යාමේදී කතුවරයා බොහෝ දුරට සංස්කෘත භාෂාවේ ආභාෂය ලබා ඇතිවාක් පමණක් නොව සංස්කෘත සාහිත්‍යයේ ආභාසයද කෙලින්ම ලබා ඇති තැන් බොහෝය. කපිල වස්තු පුර වර්ණනාවේදී,

යස්මිං විමාන මණි සිංග ජුතිප්පබන්ධ
සඤ්චුම්බිතං ජිතරවිං හරිණ්ඩික බිම්බං
නාරිජනානන සරෝජ කතාව මානං
කෝධාහි භූත මිව වණ්ණ විකාර මාප (6-9)

යනුවෙන් පුරයේ ප්‍රාසාදවල රත්මැණික්වල දිප්තිය වැටීමෙන් රතු වූ චන්ද්‍රයා පුර කන්‍යාවන්ගේ දැකුමකළු මුහුණුවලට ඊර්ෂ්‍යාවෙන් රතු වූ බවක් පවසන මෙම කවි සංකල්පනය මේ අයුරින්ම එහෙත් සංස්කෘත භාෂාවෙන් කුමාරදාසගේ ජානකීහරණයෙහි මෙසේ එයි.

යත් යෞධ ශෘංගාග්‍ර සරෝජ රාජ
රත්න ප්‍රභා විච්ඡුරිතං ශශාංක
පෞරාංගනා වක්ත්‍ර කෘතාවමානො
ජගාම රොෂාදිව ලොහිතත්වම්

භාෂාව අතින් සලකා බලන විට මෙහි ඇති භාෂාව පාලියට නිසඟීයෙන් හිමි සරලතාවෙන් බොහෝ දුරට ඈත්ව ඇති බව පෙනේ.

මන්දනිලා මන්ද භුජාව ලම්බ
සුනීල සාඛා මණිවිජනීහි
ලතාංගනා ලිංගිත සාලසාමි
සංවිජයුං විනදරම්පි ධීරං (1-88)

මෙම පද්‍යයෙහි යොදා ඇති දීර්ඝ සමාස හා සංස්කෘත පද්‍යවල අධිකව යෙදෙන මන්දනිල ලතාංගනා ලිංගිත වැනි වචනද පාලියට ආගන්තුකය. මහා කාව්‍යයක තිබිය යුතු අලංකාර, දුෂ්කර බන්ධන වැනි සියලුම දේ අඩංගු බවට සැකයක් නැත. එහෙත් ප්‍රශ්නය මෙය කොතරම් දුරට කාව්‍යාත්මකද යන්නයි. කාව්‍යමය අංශයෙන් සලකා බලන විට මේ අතිවිශාල කෘතියේ අගය ඉතා අඩු බව පෙනී යයි. අලංකාර දුෂ්කර බන්ධන වැනි දේවල් සමූහයක සංකලනය කිසි දිනෙක කාව්‍යයක් විය නොහැකිය ජීවයකින් තොරව කාව්‍යයක යොදන අලංකාරය මළ මිනියකට යොදන ආභරණයක් මෙන් නිෂ්ඵල බව ආනන්දවර්ධන නම් ශ්‍රේෂ්ඨ විචාරකයා පවසා ඇත. මේ අනුව බලන විට ජිනවංශ දීපය කාව්‍යාලංකාර කෝෂ ග්‍රන්ථයක් ලෙස එක්තරා වටිනාකමක් ඇති බව පෙනේ. මෙයට පසුව රචිත වූ විදුරුපොල පියතිස්ස හිමියන්ගෙ මහා කස්සප චරිත මහා කාව්‍යය මෙන් මෙයද බොහෝ දුරට සංස්කෘත භාෂා බලපෑම හා සංස්කෘත කාව්‍ය කල්පනාවල පරිවර්තන බව පැහැදිලි කරුණෙකි. උගත්කම පිළිබඳ වඩා වෙනස් ආකල්පයක් පැවැති යුගයක රචිත මෙම මහා කාව්‍ය දෙකම ඒවායේ අන්තර්ගත මෙබඳු පරිවර්තන යන් නිසා අගයෙන් පිරිහී ගොස් ඇත. මෑතදී රචනා කරන ලද හේන්පිට ගෙදර ඥාණසීහ හිමියන්ගේ ගාමණී ගීතාව මෙබඳු දුර්වලකම්වලින් තොර එමෙන්ම මහා කාව්‍ය ලක්ෂණවලින් බොහෝ දුරට පරිපූර්ණ කෘතියක් බව පැවැසිය යුතුය. එහෙත් මෙතෙක් රචිතව ඇති මහා කාව්‍ය (පාලි) කෘති අතුරින් සංග්‍රහ කෘතියක් ලෙස මෙන්ම උගතුන්ගේ බුද්ධි විනෝදය කරන කෘතියක් වශයෙන් ද ජිනවංශ දීපයට ඉහළ තැනක් හිමි වේ. කවිය හා බුද්ධිය දෙකක් නොව එකක් ලෙස සලකන ලද යුගයක සාහිත්‍යය පිළිබඳ ආකල්පය හා මෙම ස්වරූපය හැම අතින්ම සංසන්දනය වේ.

ආශ්‍රිත ග්‍රන්ථ


* මහාචාර්ය මලලසේකර මහතාගේ ලංකා පාලි සාහිත්‍යය

* මොරටුවේ මේධානන්ද හිමියන්ගේ ජිනවංශදීප මහා කාව්‍යය ප්‍රථම මුද්‍රණය, සංස්කරණය ( ක්‍රි ව. 1917).

* පණ්ඩිත කෙසෙල්වත්තේ වන්දමුනි හිමියන්ගේ 8-9 සර්ගවලින් යුත් ජිනවංශදීප මහා කාව්‍යය සංස්කරණයෙහි ප්‍රස්තාවනාව.

* අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ගේ පාලි සාහිත්‍යය

* පණ්ඩිත කන්නිමහර සුමංගල හිමියන්ගේ පාලි භාෂා විමර්ශනය.